# කොළඹ විශ්වවිද්‍යාලය

**<u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>**

**<u>කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ සිසු සදහා සිසුවියන් සදහා දේශන පැවැත්වීම සදහා සුදුසු ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි වර්ෂ දෙකක (02) කාල සීමාවක් සදහා කුලියට/බද්දට ගැනීම.</u>**

**<u>SAB/NCB/2018/FOT/07</u>**

කොළඹ විශ්වවිද්‍යාලය තාක්ෂණ පීඨය සිසු සිසුවියන් සදහා දේශන පැවැත්වීම සදහා සුදුසු ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි වර්ෂ දෙකක (02 ) කාල සීමාවක් සදහා කුලියට/බද්දට ගැනීම සදහා මිල ගණන් කැදවනු ලැබේ. (ආයතනයේ අවශ්‍යතාවය පරිදි බදු කාලය දීර්ඝ කරනු ඇත.)

තාක්ෂණ පීඨ ශිෂ්‍ය නේවාසිකාගාර හෝමාගම පිටිපන, මාහේන වත්ත තාක්ෂණ පරිශ්‍රයේ පිහිටා ඇති බැවින් එම පරිශ්‍රයට කිලෝ මීටර් පහළොවක් (15)ක් දුරින් පිහිටි ගොඩනැගිලි සදහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ තාක්ෂණ පීඨයේ තාවකාලික දේශන ශාලා ගොඩනැගිලි අංක 382, නවනුවර පාර, මාලබේ යන ස්ථානයේ ස්ථාපිත කර ඇති බැවින් යෝජිත ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි එම පරිශ්‍රයට කිලෝමීටර් දෙකක් (02) දුරින් පිහිටි ගොඩනැගිලි සදහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ

අවම වශයෙන් සිසු සිසුවියන් 200කට එකවර දේශන පැවැත්වීමේ හැකියාව ඇති ශාලා පහසුකම් සහිත වර්ග අඩි 15,000ක් හෝ ඊට වැඩි බිම් ප්‍රමාණයක් සහිත ගොඩනැගිලි මේ සදහා සුදුසුකම් ලබන අතර මහල් ගොඩනැගිලි නම් වඩාත් සුදුසු වේ

ගොඩනැගිල්ලේ තිබිය යුතු මූලික පහසුකම් සහ කොන්දේසි

| | | | |
|---|---|---|---|
| 01. | නිරවුල් අයිතිය | 05. | විදුලි පංකා හෝ වායු සමීකරණ පහසුකම් |
| 02. | ජලය, තෙකලා විදුලිය හා දුරකථන පහසුකම් | 06. | දේශන පැවැත්වීම සදහා සුදුසු වටපිටාව |
| 03. | මාලබේ සහ පිටිපන සිට පහසුවෙන් ලගා වීමේ හැකියාව | 07. | ආපනශාලා පැවැත්වීමේ හැකියාව |
| 04. | මෝටර් රථ ගාල් කිරීමේ පහසුකම | 08. | ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් |

මේ සදහා උනන්දුවක් දක්වන ගොඩනැගිලි හිමියන් හට අදාල ලංසු පත්‍රිකා පරිපාලන නිලධාරී / පීඨාධිපති කාර්යාලයෙන් ලබා ගත හැකි අතර ඒ සදහා ආපසු නොගෙවනු ලබන රු 3,500.00ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක " කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීම" යොමු අංක 505170600013 ට බැර කර එහි කුවිතාන්සිය පීඨාධිපති කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අදාළ ලංසු පත්‍රිකාව ලබා ගත හැක.

අයදුම් පත් නිකුත් කරන කාලසීමාව වනුයේ 2018.11.29 සිට 2018.12.19 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව. 3.30 දක්වා ලබා ගත හැක.

ඉහත කොන්දේසි සපුරාලන මිල ගණන් සඳහන් අයදුම් පත්‍ර අදාළ ගොඩනැගිල්ලේ ඡායාරූපයක් සහ ගොඩනැගිල්ලට ප්‍රවේශ විය හැකි ගමන් මාර්ගයක් ඇතුලත් දල සටහනක් සමග 2018.12.20 වන දින සවස 2.30ට ප්‍රථමයෙන් ලැබෙන සේ සභාපති ප්‍රසම්පාදන කමිටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල යුතුය අමතර තොරතුරු සඳහා 011-2078171 හෝ 011-2078646 යන අංකය අමතා ලබා ගත හැක.

මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ " <u>දේශන ශාලා සඳහා ගොඩනැගිලි කුලියට / බද්දට ගැනීම-SAB/NCB/2018/FOT/07</u>" යනුවෙන් සටහන් කල යුතු වේ 2018.12.20 දින සවස 2.30ට අදාල මිල ගණන් විවෘත කරන අතර අයදුම්කරුවන්ට හෝ වෙනත් බලයලත් නියෝජිතයකුට ඒ සඳහා සහභාගී විය හැක.

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,

කොළඹ විශ්වවිද්‍යාලය,

අංක 94, කුමාරතුංග මුනිදාස මාවත,

කොළඹ 03.